**ගම්පහ ප්‍රාදේශීය සභාව - 2023**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගම්පහ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ගම්පහ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1. පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිතියේ පරිච්ඡේද අංක 3.29 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දේපළ පිරියත උපකරණ අත්පත් කරගැනීම් වටිනාකම රු.24,674,523 ක් එකතුකර දැක්විය යුතු වුවත්, රු.25,913,782 ක් අඩුකර තිබුණි. | 2024 වර්ෂයේ අවසන් ගිණුමේදී නිවැරදි කරන බව. | ප්‍රමිතියට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කළ යුතුය. |

### 1.6.2. ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂවලට අදාල ලැබිය යුතු කඩ කුලී ආදායම රු.1,452,196 ක් කපාහැරීමේදී, සමුච්චිත අරමුදල හර කරනු වෙනුවට කඩ කුලී ආදායම් ගිණුම හර කර තිබුණි. | 2024 වර්ෂයේ අවසන් ගිණුමේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ඉඩම් සහ පිරියත වටිනාකම රු.8,898,000 ක් ඉවත් කිරීමේදී, සංචිත හා වෙන් කිරීමේ ගිණුම හර කරනු වෙනුවට සමුච්චිත අරමුදල හර කර තිබුණි. | එම | එම |
| (ඇ) | 2022 වර්ෂයේදී වැඩ අවසන් කළ පාරවල් පාලම් බෝක්කු වටිනාකම රු.7,129,082 ක් කෙරීගෙන යන වැඩ ගිණුම හර කර තිබීම සමාලෝචිත වර්ෂයේ නිවැරදි කිරීමේදී | 2024 වර්ෂයේ අවසන් ගිණුමේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කෙරීගෙන යන වැඩ ගිණුම බැර කරනු වෙනුවට සමුච්චිත අරමුදල බැර කර තිබුණි. තවද ඉඩම් ලෙස ගිණුම්ගත කළයුතු රු.864,500 ක් පාරවල් පාලම් බෝක්කු ලෙස ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඇ) | ඉකුත් වර්ෂයන්ට අදාල කර්මාන්ත ණයහිමි වටිනාකම රු.3,900,000 ක් ගිණුම්ගත කිරීමේදී, අදාල දේපළ පිරියත උපකරණ/ කෙරීගෙන යන වැඩ ගිණුම හර කරනු වෙනුවට සමුච්චිත අරමුදල හර කර තිබුණි. | එම | එම |
| (ඉ) | ඉකුත් වර්ෂයන්ට අදාල වරිපනම් වටිනාකම රු.1,262,440 ක් කපාහැරීමේදී, සමුච්චිත අරමුදල හර කරනු වෙනුවට වරිපනම් ආදායම් ගිණුම හර කර තිබුණි. | එම | එම |
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට සමුච්චිත අතිරික්තය රු.415,839,694 ක් වුවත් රු.123,750,969 ක් ලෙසද, සංචිත හා වෙන් කිරීම් ගිණුමේ ශේෂය රු.3,312,001,271 ක් වුවත් ශේෂයක් නොමැති ලෙසද, ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම ශේෂය රු.239,527,288 ක් වුවත් රු.3,843,616,285 ක් ලෙසද, වත්කම් වගකීම් ප්‍රකාශයේ දක්වා තිබුණි. | එම | එම |

### 1.6.3. අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කඩ කුලී ශේෂය රු.1,452,196 ක් කපාහැරීම සඳහා විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අනුමැතියට යොමු කර ඇති බව. | අනුමැතිය ලබාගත යුතුය. |

## 1.7. අනුකූල නොවීම්

### 1.7.1. නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරුකරන ආඥා පනතේ වගන්ති අංක 20 | 2002 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු අයකර තිබුණි. | 2025 වසරේ සිට නව තක්සේරු ප්‍රතිශෝධනය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත බව | ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | බස්නාහිර පළාත් ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ නියෝග 90 | මුද්දර ගාස්තු හා උසාවි දඩ ආදායම් මුදල් පදනම මත ගිණුම් ගතකර තිබුණි. | ඇස්තමේන්තු ගත කිරීම අපහසු බැවින් මුදල් පදනම මත ගිණුම් ගත කරන බව. | නියෝග අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.123,751,969 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම රු.8,036,241 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

#### 2.2.1. ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 21,252,000 | 20,615,409 | 17,279,875 | 42,838,443 | 20,211,200 | 24,576,548 | 20,537,105 | 42,978,575 |
| (ii) | කුලී | 5,678,400 | 7,419,115 | 7,594,810 | 1,339,174 | 8,303,400 | 7,578,365 | 7,734,024 | 2,700,683 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 820,000 | 1,278,120 | 728,320 | 9,000 | 1,520,000 | 1,102,512 | 1,226,012 | 64,500 |
| (iv) | වෙනත් ආදායම් | 18,215,805 | 18,359,896 | 18,359,896 | - | 14,211,838 | 16,515,843 | 16,515,843 | - |
| | | 45,966,205 | 47,672,540 | 43,962,901 | 44,186,617 | 44,246,438 | 49,773,268 | 46,012,984 | 45,743,758 |

#### 2.2.2. ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| i. | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.41,419,069 ක්වූ හිඟ වරිපනම් | පිළිගන්නා බව. | හිඟ වරිපනම් අදායම අයකර ගත |

| | | | |
|---|---|---|---|
| | ශේෂයෙන් වර්ෂය තුල අයකරගත් වටිනාකම රු.7,249,283 ක්වූ වූයෙන් අය කරගත් ප්‍රතිශතය සියයට 18 ක තරම් පහල අගයක් ද, වර්ෂය සඳහා බිල් කළ රු.14,769,260 ක්වූ වරිපනම් වටිනාකමෙන් වර්ෂය තුල අයකරගත් වටිනාකම රු.7,964,143 ක් වූයෙන් ප්‍රවර්ථන අයවීම් ප්‍රතිශතය සියයට 54 ක් ද වී තිබුණි. | | යුතුය. |
| ii. | කාල විශ්ලේෂණයට අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟ වරිපනම් ශේෂය වසර 10 ට වැඩි රු.23,431,264 ක්ද, වසර 5ක සිට වසර 10 ක් අතර රු.9,477,193 ක්ද, වසර 3 ක සිට වසර 5 ක් අතර රු.4,199,207 ක්ද, සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනතේ 162 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | දේපල තහනම් කිරීම් සැළසුම් කළත්, බදුකරුවන් ගෙවීම් කළ නිසා නොකරන ලද බව. | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | හෙනරත්ගොඩ උපකාර්යාලයට අදාලව වසර 10 ට වැඩි හා වසර 5 ක සිට වසර 10 ක් අතර පිළිවෙලින් රු.381,244 ක් හා රු.539,320 ක් කඩ කාමර කුලී හිඟව පැවතුණි. | පළාත් ගිණුම් කාරක සභා තීරණය ලැබෙන තුරු අත්හිටුවා ඇත. | හිඟ කඩ කුලී ආදායම අයකර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ලැබී තිබුණු මහජන පැමිණිලි සංඛ්‍යාව 495 කින් විසඳා තිබුණු පැමිණිලි 202 ක් හෙයින් සියයට 59 ක් විසඳමින් පැවතුණි. | පුද්ගල අභිමතාර්ථ ඉටු කර දීමට ඇති බලය සීමා සහිත වීම නිසා ප්‍රගතිය උපරිමයට ළඟා නොවන බව. | මහජන පැමිණිලි විසඳිය යුතුය. |

**3.2. කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 1 ක සිට වසර 3 ක් අතර රු.214,924 ක්වූ සහ වසර 3 ක සිට වසර 5 ක් අතර රු.364,109 ක්වූ ප්‍රාග්ධන ආධාර ණය ගැති ශේෂ අයකරගෙන නොතිබුණි. | මුළු ණයගැති ශේෂය රු.579,033 ක් බව. | ලැබිය යුතු ශේෂ අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වසරට අඩු රු.16,190,803 ක් ද වසර 1 ක සිට වසර 3 ක් අතර රු.14,520,682 ක් වූ ද වසර 3 ක සිට වසර 5 ක් අතර රු.1,032,350 ක් වූ හා වසර 5 ක සිට වසර 10 ක් අතර රු.66,720 ක් වූ ණයහිමි ශේෂ නිරවුල් කර නොතිබුණි. | වසරකට අඩු ණයහිමි ශේෂ ශේෂය රු.16,190,803 ක් බව. | ණයහිමි ශේෂ නිරවුල් කළ යුතුය. |

**3.3. අරමුදල් ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර ගණනාවක සිට පවත්වාගෙන එන රු.88,312 ක් වූ ඉතිරි කිරීමේ ගිණුම් ශේෂය වැඩි ප්‍රතිලාභයක් ලැබෙන පරිදි ආයෝජනය කර නොතිබුණි. | පිළිගන්නා බව. | වැඩි ප්‍රතිලාභ ලැබෙන ආයෝජනයක යෙදවිය යුතුය. |

**3.4. වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු ඉඩම්වලට අදාලව මිනුම් කර ඔප්පු සකස්කර ගැනීම, වැටවල් ගැසීම, ස්ථිර නාම පුවරු සවිකිරීම කළ යුතුව තිබුණි. | ඇස්තමේන්තුගත සීමාවන්ට යටත්ව මෙම කටයුතු කරන බව. | සභාව සතු ඉඩම් සම්බන්ධ අදාල කාර්යන් කල යුතුයි. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාන මාරුවී ගිය, විශ්‍රාම ගිය, සේවය හැර ගිය සහ මියගිය සේවකයන් 6 දෙනෙකුගේ හිඟ සේවක ණය ශේෂය රු.305,853 ක් අයකරගෙන නොතිබුණි. | දැනුවත් කිරීමේ ලිපි යවා ඇති බව. | හිඟ සේවක ණය ශේෂ අයකර ගත යුතුය. |